රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක :12/2009

මගේ අංකය : EST7/LOANS/04/3910
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

2009.05.14

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**2008 නොවැම්බර් මස ඇති වූ අධික වර්ෂාව හා සුළි සුළං තත්ත්වය මත විපතට පත් යාපනය දිස්ත්‍රික්කයේ රජයේ නිලධාරීන්ට විශේෂ අත්තිකාරම් මුදලක් ලබාදීම**

2008 නොවැම්බර් මස 25, 26, 27 තෙදින තුල යාපනය දිස්ත්‍රික්කයට ඇති වූ අධික වර්ෂාව හා සුළි සුළඟින් විපතට පත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පදිංචි සුදුසුකම් ලත් රජයේ නිලධාරීන්ට පොලී රහිත විශේෂ අත්තිකාරම් මුදලක් ගෙවීමට තීරණය කර ඇත.

02. මෙම විශේෂ ණය මුදල නිලධාරියාගේ එක් මසක දීමනා රහිත ඒකාබද්ධ වැටුපට සමාන විය යුතු අතර. සමාන මාසික වාරික දහයකින් ආපසු අයකර ගත යුතුය.

03. මෙම ණය මුදල ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 3 වගන්තියේ සඳහන් වැටුපෙන් අඩුකල හැකි මාසික අඩුකිරීම්වල එකතුවේ සීමාවන්ගෙන් නිදහස් වේ.

04. ණය මුදල ඉල්ලීමේ දී නිවසට හා බඩු බාහිරාදියට සිදුවී ඇති අලාබහානි පිළිබඳව ඇස්තමේන්තුවක් ඉදිරිපත් කල යුතුය.

05. මෙම ඇස්තමේන්තුව ප්‍රකාර අලාබහානි සිදුවී ඇති බව අදාල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී විසින් සනාථ කලයුතු අතර, ප්‍රාදේශීය ලේකම් නිර්දේශ කල යුතුය.

06. නිලධාරියා හෝ ඔහුගේ පවුලේ අය පදිංචිව සිටින්නාවූ ද නිලධාරියාට හෝ ඔහුගේ කලත්‍රයාට හෝ අයිතිවූ ද නිවසකට, බඩු බාහිරාදියට අලාභහානි වී තිබේ නම් ඒවා අලුත්වැඩියා කිරීම සඳහා ද ණය ලබාගත හැකිය.

07. මෙම ණය මුදල සඳහා ඇපකරුවන් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. එහෙත් තවකාලික හා අනියම් සේවකයන්ට මෙම ණය අත්තිකාරම් මුදල ගෙවන්නේ නම් රජයේ ස්ථිර සේවකයකු ඇපකරුවකු ලෙස ඉදිරිපත් කල යුතුය.

08. **2009** ඇස්තමේන්තුවට අනුව රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම් යටතේ නියම කරන ලද උපරිම වියදම් සීමා තුල රැදෙමින් මෙම ගෙවීම් කටයුතු කළයුතු වේ. කිසිම හේතුවක් නිසාවත් මෙම කරුණු හේතු කොටගෙන සීමා සංශෝධන භාරගනු නොලැබේ.

09. 2009.07.31 වන දිනෙන් පසු මෙම අරමුණ සඳහා ණය අත්තිකාරම් ගෙවීම නොකළ යුතුය.

10. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව නිකුත් කරනු ලැබේ.



ඩී. දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය